**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම,සැසඳුම් ප්‍රකාශනය ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ගණන් දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125 (1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 256 ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය , අභ්‍යන්තර පාලන විධිවිධාන යොදාගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්ය සාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීන්ගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ------------------------------------------------------- | | ---------------------------------- | --------------- |
| මුදල් රෙගුලාසි<br>-------------------- | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම | 2.3 |
| 128(1)(ආ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |
| 128(1)(ඉ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යන බව | අනාර්ථික ගනුදෙනු | 2.5 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ, සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති | පාඩු හා හානි | 2.4 |

කාර්ය පටිපාටි ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව

2. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

2.1 **කාර්යසාධනය**

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 හා 2017 වර්ෂවලදී එකතුව රු.7,661,139 ක පුටු, තහඩු හා කැනපි හට් ඒකක 4,440 ක් ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබුණද, මෙම භාණ්ඩ වර්ග බෙදා හැරීම තුළින් වූ ආර්ථික, සමාජීය සංවර්ධනය පිළිබඳ පසුවිපරම් සිදු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 05 දිනැති අංක MNPEA 06/2017 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාර විමධ්‍යගත අයවැය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩි දියුණු කිරීම මෙන්ම සමාජ සුභසාධනය ඉලක්ක කරගත් ව්‍යාපෘති සඳහා ආයෝජනය කල යුතු අතර ඒ අනුව ව්‍යාපෘති තෝරා ගත යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යහගුණ දැක්ම පදනම යනුවෙන් වූ සංවිධානයක් වෙත රු.500,000 ක් වටිනා කාර්යාලීය උපකරණ ලබා දී තිබුණි.

2.2 **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 1999 ජූලි මාසයේදී අනතුරකට භාජනය වීමෙන් සිදුවූ රු.189,360 ක අලාභය අයකර ගැනීම සඳහා අදාළ රියදුරුට විරුද්ධව 2001 වර්ෂයේදී මීගමුව දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා තිබුණද එම කටයුතු නිරාකරණය වී නොතිබුණි.

(ආ) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2006 වර්ෂයේ අනතුරකට පත්වීම හේතුවෙන් වූ රු.234,890 ක අලාභය නිරවුල් කර නොතිබුණි.

(ඇ) ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක 2015 මැයි මාසයේදී සිදු වූ අනතුරෙන් රු.187,503 ක අලාභය පියවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබූ නමුත් මෙම අලාභය වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2014 ජූලි මාසයේදී මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ මුදල් වංචාවේදී මධ්‍යම රජයට අයත්

රු.166,459 ක් අස්ථාන ගත වී තිබූ අතර, මෙයින් රජයට සිදු වූ පාඩුව රු.19,447 ක් විය.ඉතිරි රු.147,012 ක මුදල විවිධ රාජකාරි ඉටු කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු වටිනාකමක් විය. මෙම මුදල් වංචාව සම්බන්ධ කාර්යාල පරීක්ෂණය අවසන් කර තිබුණද අයවීම් කටයුතු අවසන් වී නොතිබුණි.

2.3 **අනාර්ථික ගනුදෙනු**

-----------------------

මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම සඳහා අනුමත වී තිබූ රුපියල් ලක්ෂ 250 කින් රු.2,021,952 ක් වැය කර නල ළිං 02 ක් ඉදි කර තිබුණි. කොට්ඨාශයේ ජල ප්‍රශ්නය විසඳීම සඳහා එම නල ළිං දෙක ප්‍රයෝජනයට ගෙන ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා 2017 වර්ෂයේ ප්‍රතිපාදන මුදල් රු.500,000 ක් භාවිතා කරන බව දන්වා තිබුණද, 2017 වර්ෂයේදී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණ අතර, ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහාද පියවර ගෙන නොතිබුණි.

2.4 **කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා කළමණාකරණය

-----------------------------

(i) ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගම්පහ දිස්ත්‍රික්කයට 2016 හා 2017 වර්ෂවල ආපදා හානි ප්‍රතිපූර්ණය සඳහා රු.452,919,888 ක ප්‍රතිපාදන ප්‍රදේශීය ලේකම් කාර්යාල 13 ක් වෙත ලබා දී තිබූ අතර, ගම්පහ දිස්ත්‍රික් ආපදා කලමණාකරණ ඒකකය විසින් පාලම්, බෝක්කු, ඇලමාර්ග අලුත්වැඩියාව සඳහා රු.59,038,484 ක් වැය කර තිබුණි. එසේ වුවද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක ට අයත් බල ප්‍රදේශ තුල අබලන් අනතුරුදායක හා අනාරක්ෂිත තත්ත්වයේ අළුත්වැඩියා කළ යුතු පාලම් බෝක්කු, ඇල මාර්ග හා අමුණු 1,171 ක් අළුත්වැඩියා කර නිසි ලෙස නඩත්තු කිරීම සඳහා ප්‍රමාණාත්මක අවධානයක් යොමු නොවීම හා ගංගා ඇල රක්ෂිතවල අනවසර පදිංචි වීම් නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ සුළු වැසි සහිත අවස්ථාවලදී පවා ජලයෙන් යටවන තත්ත්වයක් පැවතුණි.

(ii) බියගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2016 වර්ෂයේදී ඇති වූ ගංවතුර තත්ත්වයන් හේතුවෙන් විපතට පත්වූවන් වෙත පිසූ ආහාර ලබාදීම සඳහා ග්‍රාම සේවා නිලධාරීන්ට ප්‍රතිපූර්ණය කළ යුතු රු.1,814,734 ක මුදල් 2018 ජනවාරි 5 දින වන තෙක්ම ලබාදී නොතිබුන අතර මේ සම්බන්ධයෙන් වරින් වර ආපදා කලමණාකරන අමාත්‍යාංශය වෙත දන්වා තිබුණද ප්‍රතිපාදන ලැබී නොතිබුණි.

(ආ) උග්‍ර ජල හිඟය

------------------

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 123 න් 121කට 2017 ජනවාරි මාසයේ සිට පැවති උග්‍ර ජල හිඟයට පිළියම් ලෙස රු.5,840,009 ක වියදමින් ජල ලීටර් 7 200 000 ක් දින 205 ක් බෙදා හැර තිබුණි. බල ප්‍රදේශයේ ජල හිඟයට ප්‍රධාන හේතු ලෙස පස් කඳු කපා ඉවත් කිරීම, වන වගාව කපා දැමීම, මා ඔයේ වැලි ගොඩ දැමීම නිසා ගං පතුල පහල යාම, මහා පරිමාණ මැටි හැරීම, භූගත ජලය වාණිජ මට්ටමින් අලෙවි කිරීම, අධීක්ෂණයකින් තොරව පෞද්ගලික ගැඹුරු නළ ළිං ඉදිකිරීම හා කළු ගල් කැඩීම යන

කරුණු හඳුනාගෙන තිබුණද ඒවා අවම කිරීම සඳහා කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් වෙත පූර්ණ බලතල ලැබී නොතිබුණි.

(ඇ) රජයේ ඉඩම්
---------------

(i) මීරිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩම්වලට අදාලව ජනාධිපතිවරයා විසින් අත්සන් කල දීමනා බලපත්‍ර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර අදාල අයිතිකරුවන් වෙත භාර දියයුතු නමුත් අයිතිකරුවන් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි ඉඩම් කොටස් 9 ක්, අදාළ දීමනා පත්‍රයට හිමි ඉඩමට වෙනත් දීමනා පත්‍රයක් ලබා දී ඇති ඉඩම් කට්ටි 18 ක්, දීමනා පත්‍ර හිමිකරු මියගොස් ඇති හා වෙනත් පාර්ශවයක් පදිංචි වී ඇති ඉඩම් කට්ටි 02 ක් හා හිමිකරු මියගොස් උරුමක්කරුවන් පදිංචි වී සිටින ඉඩම් කට්ටි 04 ක් වශයෙන් විවිධ හේතූන් මත දීමනා පත්‍ර භාර නොදුන් අවස්ථා පැවතුණි.

(ii) මීනුවන්ගොඩ ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර අදාළ අයිතිකරුවන්ට භාර නොදුන් බලපත්‍ර 24 ක් පැවතුණි. මෙම ඉඩම් කට්ටි අතුරින් 13 ක දීමනා පත්‍ර හිමියන් මියගොස් ඇති බව හා උරුමකරුවන් පදිංචි වී සිටින බව ග්‍රාම නිලධාරී වාර්තා කිරීම නිසා එම උරුමක්කරුවන්ට දීමනා පත්‍රය ලැබෙන සේ කටයුතු කරන මෙන් ප්‍රාදේශීය ලේකම් විසින් 2017 ජූනි මාසයේදී දැනුම් දී තිබුණද 2018 අප්‍රේල් 30 වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. තවද ඉඩම් කට්ටි 06 ක දීමනා පත්‍ර ලාභීන් පදිංචි වී නොමැති වීම හා ඉඩම් කට්ටි 05 ක් සඳහා ඊට පෙර වෙනත් ඔප්පු නිකුත් වී තිබීම නිසා දීමනා පත්‍ර ලබා දී නොතිබුණි.

(ඈ) නිල නිවාස
--------------

බියගම හා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සතු ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිල නිවාස වසර ගණනාවක සිට ප්‍රයෝජනයට නොගැනීම නිසා එකී නිල නිවාස ප්‍රධාන ගබඩාව ලෙස පාවිච්චි කරමින් පැවතුණි.

(ඉ) සේවා පියස්
---------------

(i) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නැගෙනහිර වැල්ලවීදිය ප්‍රජා ශාලාව හා සේවා පියස ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භ කර රු.4,000,000 ක් වර්ෂ 4 ක් පුරා වියදම් කර තිබුණද ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොගැනීම නිසා නිම කිරීමට නොහැකි වී තිබුණි.

(ii) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

- 2015 වර්ෂයේදී වෙන් කළ රු.300,000 ක මුදලක් යොදවා සැලැස්මකින් තොරව එල්ලංගල සේවා පියස ඉදිකිරීම ආරම්භ කර තිබුණද කොන්ත්‍රාත්කරු හා රජය අතර වූ ගිවිසුම දෙපාර්ශවයම අත්සන් කර නොතිබුණි. මෙම සේවා පියස භෞතික පරික්ෂාවේදී කණු ඉහල නංවා බිත්ති නොබැද වහලය ගසා තිබුණි.

- වල්පිටමුල්ල සේවා පියස් ගොඩනැගිල්ල නිසි සැලැස්මකින් තොරව 2015 වර්ෂයේදී රු.300,000 ක ප්‍රතිපාදනයකින් අලුත් වැඩියාව සිදුකර ජල විදුලි

පහසුකම් සැපයීමකින් තොරව  වැඩ අවසන් කර තිබුණද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

- එක් සේවා පියසක පවුල් සෞඛ්‍ය සේවිකාව පමණක් හා තවත් සේවා පියස් 3 ක ග්‍රාම නිලධාරී පමණක් සේවයේ නිරත වෙමින් තිබුණි.
- රුපියල් ලක්ෂ 20 ක  ප්‍රතිපාදන යොදවමින් යටියන නැගෙනහිර නිල සෙවන ගොඩනැගිල්ල ඉදිකර තිබූ අතර මෙම ඉඩමේ අ        යිතිය රජයට පවතිද යන්න පිළිබඳ ලිඛිත සාක්ෂි නොතිබුණි.  කිසියම් පාර්ශවයක් විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කරන අවස්ථාවේදීම මෙහි උරුමය පිළිබඳ පැමිණිලි කර තිබුනද ඒ පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු කිරීමකින් තොරව ඉදිකිරීම කර තිබුණි.

(iii) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු. ලක්ෂ 59 ක් වැය කර ඉදි කරන ලද ප්‍රජාශාලා/ සේවා පියස් 6 ක් අභාවිතව තිබූ අතර   රු.ලක්ෂ 70 ක් වැය කර 2017 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර ඇති සේවා පියස් 04 ක් 2018 මැයි වන විටත් විවෘත කර නොතිබුණි.

(iv) ගම්පහ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2015 වර්ෂයේ ඉදිකරන ලද සේවා පියස් 08 කට අදාල ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2018 මැයි වන විටත් අවසන් කර නොතිබුණි.

(v) ගම්පහ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පැවති සේවා පියස් 25 ක ජලය හා විදුලිය නොමැති වීම, කාමර වෙන් කල යුතු වීම, සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම, බිත්ති පුපුරා යාම හා දොර ජනෙල්වල අඩුපාඩු යනාදී වූ ගැටළු පැවතුණි.

(ඊ) වැඩ බැලීමේ පත්වීම්

------------------------

2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාලව ග්‍රාම නිලධාරීන් 91 දෙනෙකු වර්ෂ ගණනාවක සිට වසම් කිහිපයක වැඩ බැලීමේ රාජකාරී ඉටු කර තිබුණි.

(උ) විශ්‍රාම වැටුප් අංශය

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක විශ්‍රාමිකයින් 298 දෙනෙකුට තාවකාලික ගොනු හෝ නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක තාවකාලික ගොනු හෝ නොමැති වූ විශ්‍රාමිකයින් 50 කගේ ගොනු සකසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද 2018 පෙබරවාරි වන විටත් ඒ සඳහා අනුමැතියක් ලැබී නොතිබුණි.

(iii) ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම, ලිපිගොනු අස්ථාන ගත වීම හා ගොනු නොමැති වීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ගොනු සංඛ්‍යාව 1144 ක් විය.

(iv) මීගමුව, කටාන හා කැලණිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජාතික හැඳුනුම්පත් අංකය නොමැතිව හා සාවද්‍ය ලෙස හැඳුනුම්පත් අංක සඳහන් කර දත්ත පද්ධතිය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම් කර ඇති අවස්ථා 44 ක් පැවතුණි

(v) විශ්‍රාමිකයෙකු හෝ වැන්දඹුවක හෝ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභයක් ලබන අයකු මියගිය වහාම එම තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ගෙවීම් නතර කිරීම කඩිනමින් සිදු කළයුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විශ්‍රාමිකයා මියගොස් දින 69 ත් 1070 ත් අතර කාල ප්‍රමාදයකට පසු ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති අවස්ථා 79 ක් පැවතුණි. මෙම මියගිය නිලධාරීන් සඳහා කල වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමේ අවදානමක් පැවති අතර දැනුම්දීම් ප්‍රමාදයට වගකිව යුතු අය සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(vi) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමිකයෙකු 2015 ජනවාරි 01 දින මියගොස් ඇති අතර ඔහු වෙනුවෙන් ලංකා බැංකුවේ වැලිසර ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම වෙත 2015 ජනවාරි මස සිට 2016 දෙසැම්බර් මාසය දක්වා කාලය තුල රු.483,937 ක මුදලක් ප්‍රේෂණය කර තිබුණි. 2017 සැප්තැම්බර් මසදී රු.376,316 ක මුදලක් ආපසු ගෙන්වා ගෙන ඇතත් තවදුරටත් අයවිය යුතු රු.107,621 ක මුදල මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(vii) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී නොවන ලිපිගොනු ගණන 3662 ක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් මෙම ලිපිගොනු සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(viii) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 19 දෙනෙකු එම බල ප්‍රදේශයේ පදිංචි අය නොවූ අතර ලිපිගොනු නොමැති වීම නිසා එම අයගේ තොරතුරු අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මාරු කිරීමට නොහැකි වී තිබුණි.

(ix) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාම වැටුප් සඳහා හිමිකමක් නොමැති උප තැපැල් ස්ථානාධිපතිවරයෙකු විශ්‍රාම යෑමේදී ඔහු වෙත රු.454,918 ක මුදලක් විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබූ අතර එම වරද අනාවරණය කර ගැනීමෙන් පසු වාරික වශයෙන් එකතුව රු.46,000 ක් ආපසු අයකර ගෙන තිබුණි. 2014 ජූලි 31 දින උක්ත විශ්‍රාමිකයා මියගොස් ඇති අතර රජයට රු.408,918 ක පාඩුවක් සිදු වී තිබුණි. මේ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් සොයා බලා රජයට වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදන | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 799.75 | 768.02 | 31.73 | 3.97 |
| | මූලධන | 61.30 | 35.76 | 25.54 | 41.66 |
| | **එකතුව** | **861.05** | **803.78** | **57.27** | **6.65** |
| 2014 | පුනරාවර්තන | 728.67 | 723.38 | 5.29 | 0.73 |
| | මූලධන | 41.65 | 24.45 | 17.20 | 41.29 |
| | **එකතුව** | **770.32** | **747.83** | **22.49** | **2.92** |
| 2015 | පුනරාවර්තන | 949.43 | 944.99 | 4.44 | 0.47 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 294.80 | 77.31 | 217.48 | 73.77 |
| | **එකතුව** | **1,244.23** | **1,022.30** | **221.92** | **17.83** |
| 2016 | පුනරාවර්තන | 1,011.80 | 997.43 | 14.37 | 1.42 |
| | මූලධන | 167.00 | 166.87 | 0.13 | 0.08 |
| | **එකතුව** | **1,178.80** | **1,164.30** | **14.50** | **1.23** |
| 2017 | පුනරාවර්තන | 999.33 | 993.17 | 6.16 | 0.62 |
| | මූලධන | 468.00 | 125.87 | 342.12 | 73.10 |
| | **එකතුව** | **1,467.33** | **1,119.04** | **348.28** | **23.73** |

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

-----------------------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ 31 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 4,973.44 ක් හා රු.මිලියන 125.72 ක් වශයෙන් එකතුව රු.මිලියන 5,099.16 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එකතුව රු.මිලියන 3,932.35 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,166.8 ක් හෙවත් සියයට 22.88 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

2.6 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

--------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

-------------------------------------------------

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 256011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| <u>වියදම</u> | | <u>ලැබීම්</u> | | <u>හර ශේෂය</u> | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 103 | 102.97 | 64 | 73.3 | 280 | 270.31 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශයේ අයවීම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ශේෂය හැර රු.1,926,475 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 3 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණත් ඒවා අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරිනියක නියමිත අධ්‍යාපන සුදුසුකම් නොමැතිව සේවයේ රැඳී සිටීමේ හේතුව මත වැඩ තහනමට ලක්ව තිබූ අතර ඇයගේ රු.71,483 ක ණය ශේෂය 2018 අප්‍රේල් 30 වන විටත් අයනොවී පැවතුණි.

(ඇ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුදල් වංචාවක් හේතුවෙන් සේවය අත්හිටුවා ඇති නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.337,390 ක ණය ශේෂයක් පැවතුණි.

2.7 **පොදු තැන්පත් ගිණුම**

-------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 673.99 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාලව වර්ෂ 2 ඉක්මවූ අවස්ථා 261 කදී කොන්ත්‍රාත් සඳහා රඳවා ගැනීම් වටිනාකම රු.8,757,005 ක් හා කාර්යාල 4 ක අවස්ථා 32 කදී තෙවන පාර්ශව ගෙවීම් වටිනාකම රු.433,350 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ඉඩම් වන්දි ගෙවීම් සඳහා වූ වර්ෂ 10 ඉක්මවා ඇති අවස්ථා 28 කට අදාල රු.6,268,552 ක තැන්පතු මුදලක් දිගින් දිගටම පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**2.8** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**--------------------------------------------------------------------------------------------------**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1,369.34 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 40 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 64 | 52 | 12 |
| (iii) | ද්විතීයික මට්ටම | 3153 | 2655 | 498 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 132 | 112 | 20 |
| | එකතුව | 3390 | 2859 | 531 |